දශම සංඛ්‍යා ප්‍රතිශත ලෙස දැක්වීම

0.4	0.27	2.7
$= \frac{4}{10}$	$= \frac{27}{100}$	$= \frac{27}{10}$
$= \frac{4\times10}{10\times10}$	$= 27\%$	$= \frac{27\times10}{10\times10}$
$= \frac{40}{100}$		$= \frac{270}{100}$
$= 40\%$		$= 270\%$

100න් ගුණ කිරීම මගින් ප්‍රතිශත ලබා ගැනීම

$\frac{3}{4}$	$\frac{17}{20}$	0.7	1.43
$\frac{3}{4} \times 100$	$\frac{17}{20} \times 100$	0.7×100	1.43×100
$\frac{300}{4}$	$\frac{1700}{20}$	70	143
75%	85%	70%	143%

01. භාග ලෙස ලිවීම මගින් ප්‍රතිශත ලෙස දක්වන්න.

i 0.47 ii 0.7 iii 1.25 iv 3.4 v 0.345

02. 100න් ගුණ කිරීම මගින් ප්‍රතිශත ලෙස දක්වන්න.

i 0.8 ii 0.08 iii 2.3 iv 2.03

v $\frac{4}{5}$ vi $\frac{1}{10}$ v $2\frac{1}{4}$ vi $\frac{7}{200}$

03. පසුගිය වාරයේ පාසැල පැවැත්වූ දින ගණනින් 0.57 ක පැමිණීමක් අමල් ගෙන් ද $\frac{3}{5}$ ක පැමිණීමක් කමල් ගෙන් ද වාර්තා වී තිබුණි. ප්‍රතිශත පිළිබඳ දැනුමෙන් වඩා හොඳ පාසැල් පැමිණීම කාගේදැයි සොයන්න.

04. එක්තරා බැංකුවකට පැමිණි මුළු පිරිසෙන් $\frac{1}{2}$ ක් මුදල් තැන්පත් කිරීම සඳහා ද 0.35 ක් මුදල් ලබාගැනීම සඳහා ද 15% ක් ණය ඉල්ලුම් කිරීම සඳහා ද පැමිණ තිබුණි. වැඩිම දෙනෙක් පැමිණ තිබුණේ කුමන කාර්යයක් සඳහා දැයි ප්‍රතිශත පිළිබඳ දැනුමෙන් සොයන්න.

05. නිමල් ගේ මුළු මාසික ආදායමෙන් $\frac{18}{25}$ ක් රැකියාවෙන් ද 15% ක් ව්‍යාපාර වලින් ද 0.13 ක් ගොවිතැන් වලින් ද ලැබේ. ඔහු වැඩිම ආදායමක් ලබන්නේ කුමන ආකාරයට දැයි ප්‍රතිශත පිළිබඳ දැනුමෙන් සොයන්න.